**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**

------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය.

-----------------------------------------

අංක පීඊඞී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් , දින 92 ක් ප්‍රමාදවී මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

සෙවකයින්ගේ දල වැටුප වෙනුවට මූලික වැටුප පදනම් කර ගෙන පාරිතෝෂිත ගණනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කිරීම රු. 253,730 ක් අඩුවෙන් සිදු කර තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනිමට හෝ නොහැක විය.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| i. ස්ථාවර වත්කම් | 44,246,387 | ස්ථාවර වත්කම් ලේඛණ |
| ii.ලෙජර් ගිණුම් 23 | 2,227,866 | වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන ශේෂ පරීක්ෂා කිරීමට අදාල කිසිදු තොරතුරක් ඉදිරිපත් නොවුණි. |

1.2.4 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

නීති,රීති රෙගලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත | පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබුණි.<br>(i) ආණ්ඩුව විසින් සකස් කරන ලද සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජික හා ආර්ථික සංවර්ධනය සඳහා ආණ්ඩුවේ නොවූ විදේශිය හා දේශිය නියෝජ්‍යත්වල ආධාර ලබාගැනීම.<br>(ii) ජාත්‍යන්තර සාගිනි නවීමේ ව්‍යාපාර සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන සංගම් හෝ සමිති සමඟ සහයෝගීවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | |
| | මු.රෙ. 371 (2) | | "තත් කාර්ය" අතුරු අගිමයක් වශයෙන් එක් අවස්ථාවක රු.20,000 කට නොවැඩි මදලක් ලබාගත හැක්කේ මාණ්ඩලික නිලධාරීන් සඳහා පමණක් වුවද , මාණ්ඩලික නොවන නිලධාරීන් 07 දෙනෙකු වෙතද රු.20,000 බැගින් අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. |
| | මු.රෙ. 1645 | | සමාලෝචිත වර්ෂයේ කිසිදු වාහනයක් සම්බන්ධයෙන් ලොග් සටහන් පවත්වා නොතබුණි. |
| (ඇ) | අංක 01/2002 හා 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 9.3.1 ජේදය | | ආයතනයේ නිල නාමය ආයතනය සතු වාහනවල පින්තාරුකර නොතිබුණි. |
| (ඈ) | අංක 13/2008 හා 2008 ජුලි 28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 ජේදය. | (i) | හිටපු සභාපතතුමිය සඳහා හිමි ඉන්ධන දීමනාව රු.13,140 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී රු.20,700 බැගින් මාස 03 ක කාලයකදී රු.62,100 ක ඉන්ධන ලබාගෙන තිබුණි. |
| | | (ii) | සමාලොචිත වර්ෂයේ ජුලි මාසය දක්වා හිටපු සභාපතිනිය විසින් රු.107,253 ක් වටිනා අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණු අතර, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | |
| | 5.2.1 වගන්තිය | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ගිණුම් පිළියෙල කර නොතිබුණි. |
| | 4.3 වගන්තිය | | අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තා රේඛීය අමාත්‍යාංශය වෙත යවා නොතිබුණි. |
| | 7.4.1 වගන්තිය | | විගණන කමිටු රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවද , සමාලෝචිත වර්ෂය සඳහා රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි. |
| | 6.5.3 වගන්තිය | | මණ්ඩලය විසින් 2000 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.14.1 ජේදය | (i) | රු.100,000 ට අඩු හා රු.50,000 ට අඩු මිලදී ගැනීම් සඳහා අවම වශයෙන් මිල කැඳවීම් 3 ක් ලබාගතයුතු බව සඳහන් කර තිබණද , මෙම ආයතනය විසින් රු.75,355 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීමේ අවස්ථා 02 කදී එලෙස කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | ඍජු මිලදී ගැනීම් සඳහා වන අධිකාර් බලය පිළිබඳ අවධානය යොමු නොකර රු.10,355 ක් වටිනා විධායක පුටුවක් මිලදීගෙන තිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.314,771 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,258,334 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.2,573,105 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. රජයේ ප්‍රදානවල රු.2,380,902 ක වැඩිවීම හා වෙනත් මෙහෙයුම් ආදායම්වල රු.5,564,268 ක වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2010 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව එම ක්‍රියාකාර සැලැස්ම සමග පරීක්ෂාකල හැකි වන පරිදි සකස්කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේ ආරම්භ කරන ලද මොණරාගල දිස්ත්‍රික්කයේ දෙහි අලෙවි කිරීමේ ගැටළු විසඳීමේ ව්‍යාපෘතිය 2010 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මේ ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන තිබුණද , එම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඇ) ක්‍රියාකාර සැලැස්මට ඇතුලත් නොවූ පහත සඳහන් ව්‍යාපෘතින් ක්‍රියාත්මක කර වියදම් දරා තිබුණි.

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| | රු. |
| එක් ගමක්-එක් බෝගයක් වැඩසටහන. | 973,963 |
| පළතුරුවලින් අතුරු නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම. | 794,453 |

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

2007 වර්ෂයේ ආරම්භ කරන ලද ඉදිකටු වැව සහ වැලි වැව යන වැව් දෙකෙහි වාන් සැදීම හා ඇල වේලි සකස් කිරීම සඳහා ප්‍රතිපාදන මුදල වූ රු.454,746 ක් වෙනත් ව්‍යාපෘති වෙනුවෙන් යෙදවීම නිසා එම වැඩකොටස් සමාලෝචිත වර්ෂයේදීද, ඉටු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

----------------------------

අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු සතු වාහන 10 ක් වර්ෂ 07 කාලයක සිට ආයතනයේ ප්‍රයෝජනය සඳහා යොදවා තිබුණු අතර එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

අනුමත කාර්ය මණ්ඩලය 45 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 33 ක් වූ බැවින් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 12 ක් විය. මෙයට අමතරව අනුමැතියකින් තොරව අනියම් සේවකයන් 95 දෙනෙකුද, බඳවාගෙන තිබුණි.

2.6 සංයුක්ත සැලැස්ම

--------------------

2010 - 2012 වර්ෂවලට අදාලව සංයුක්ත සැලැස්මක් සකස්කර තිබුණද , එය සකස්කිරීමේදී අංක පීඊඩී / 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ජේදයේ සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

2.7 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර (4.2) % සිට 402 % දක්වා විචලනයන් වුයෙන් , අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

3. පද්ධති සහ පාලන

---------------------

විගණයේදී නිර්කෂණය වූ පද්ධති හා පාලනයේ දුර්වලතා සභාපතිවරයා වෙත වර්න්වර මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත.පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) මූලා‍ය ප්‍රකාශන
(ආ) වාහන පාලනය
(ඇ) සේවක කළමනාකරණය
(ඇ) වත්කම්